

මහාචාර්ය නන්දසේන මුදියන්සේ මහතා

## මහාචාර්ය නන්දසේන මුදියන්සේ

පූජ්‍ය මහාචාර්ය ඕක්කම්පිටියේ පඤ්ඤාසාර හිමි

සිංහල භාෂා සාහිත්‍යය විෂයෙහි ප්‍රවීණ ශාස්ත්‍රීය සේවයක පුරෝගාමී සම්ප්‍රදායක් සැපයූ විද්වතකු වශයෙන් මහාචාර්ය නන්දසේන මුදියන්සේ මහතා සම්මානයට පාත්‍ර ව සිටියි. පුරාවිද්‍යාව, පුරාක්ෂර විද්‍යාව, කලා ශිල්ප එතුමාගේ විෂය ක්ෂේත්‍රය ව්‍යාප්ත ව පැවති පරිචාර විෂය ප්‍රදේශය වෙයි. ක්‍රි.ව. 1928 දෙසැම්බර් 13 දින බස්නාහිර පළාතට අයත් සමණබැද්ද එතුමාගේ ජන්ම ග්‍රාමය විය. මූලික අධ්‍යාපනය හංවැල්ල ද්විභාෂික පාඨශාලාවෙන් ලද මුත් 1953, 1957 වර්ෂවල දී සිංහල පිළිබඳ ඩිප්ලෝමා හා ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පරීක්ෂණවලින් උසස් ලෙස සාමර්ථ්‍යය ලැබීය.

අනතුරු ව වැඩිදුර අධ්‍යයන කටයුතුවලට කැපවුණු ඔහු සෙල්ලිපි පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ද පුරාවිද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය ද දිනා ගත්තේ ය. මෙම පශ්චාද් උපාධි කටයුතුවල දී පුරාවිද්‍යාව හා සිංහල විෂය පිළිබඳ ප්‍රාමාණික විද්වතකු වශයෙන් ප්‍රකටව සිටි අභාවප්‍රාප්ත මහාචාර්ය සෙනරත් පරණවිතාන සූරීන්ගේ ආශ්‍රය ම මහාචාර්ය නන්දසේන මුදියන්සේ සූරීන්ගේ ජීවිතයේ අනුබලය විය. ඒ නිසා ම විද්වතකු තුළ පැවතිය යුතු ශාස්ත්‍රීය ගැඹුර මහාචාර්ය නන්දසේන මුදියන්සේ තුළ නොඅඩුව පැවතිණි.

එපමණක් නොව ලන්ඩන් විශ්වවිද්‍යාලයට සම්බන්ධ වාග්විද්‍යාව හා ශබ්ද විද්‍යාව හදාළ එතුමා පාලි - සංස්කෘත හා දෙමළ ආදී ප්‍රාචීන භාෂාවන් හා ඉංග්‍රීසි, ප්‍රංශ, ජර්මන් වැනි ප්‍රතීචීන භාෂාවන් පිළිබඳ ව ද ප්‍රාමාණිකත්වයක් ලබා ගත්තේ ය. සිංහල භාෂා සාහිත්‍යය විෂයෙහි දැනුමත් පෙරපර දෙදිග භාෂා පිළිබඳ කෞශල්‍යයත් එතුමාගේ ශාස්ත්‍රීය ලෝකය වඩාත් අලංකාර කළේ ය.

මහාචාර්ය නන්දසේන මුදියන්සේ මහතාගේ ජීවිතය අත්දැකීම් මඤ්ජුසාවකි. එතුමා 1947-1952 කාලය තුළ රජයේ පාසැල් ගුරුවරයකු වශයෙන් සේවය කොට ඇත. අනතුරු ව ගම්පොල